**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.17 පැය 1930 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 81 /2025 |
| විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk | | | | |

## අයිස් මත්ද්‍රව්‍ය හා රුපියල් විසි අට කෝටි තිස්තුන් ලක්ෂයක මුදලක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය.

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කරගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.01.16 වන දින දොරටියාව පොලිස් වසමේ දඹුල්ල කුරුණෑගල මාගර්යේ කිරිවවුල, තෝරයාය ප්‍රදේශයේදී, පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශයේ මහනුවර උප ඒකකයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 18 ක් සන්තකයේ තබාගෙන කැබ් රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන බෝගමුව පොලිස් වසමේ හංගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු ගමන් කරමින් සිටි කැබ් රථයේ රියදුරු අසුන යට බෑගයක තිබී **හෙරොයින් ජාවාරමෙන් උපයාගත් බවට සැක කරන රුපියල් දෙකෝටි තිස්පන් ලක්ෂයක මුදලක් (රු. 23,500,000/-) හා මැණික් ගල් බවට සැක කරන විවිධ වණර් වලින් යුත් පාෂාණ කොටස් 70 ක පමණ** ප්‍රමාණයක් සොයා ගෙන ඇත. තවද සැකකරුගෙන් වැඩිදුර ප්‍රශ්න කිරීමේදී, අනාවරණය වූ තොරතුරු මත හංගමුව ප්‍රදේශයේ සැකකරු පදිංචිව සිටින නිවසේ සේප්පුවක් තුළ තිබී **හෙරොයින් ජාවාරමෙන් උපයාගත් බවට සැක කරන රුපියල් විසිපන්කෝටි අනුඅට ලක්ෂයක මුදලක් (රු. 259,800,000/-) හා එම නිවසේ තිබූ වෑන් රථයක්** පොලිස් භාරයට ගෙන ඇත.

මෙම සැකකරු දැනට ඩුබායි රාජ්‍යයේ සැඟව සිටින සංවිධානාත්මක අපරාධ හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකුගේ සමීපතමයෙකු වශයෙන් සිටිමින් ඔහුගේ මෙහෙයවීම මත මෙම මත්ද්‍රව්‍ය ජාවාරම සිදුකර ඇති බවට දැනට සිදුකරන ලද විමශර්න වලදී අනාවරණය වී ඇත.

ඉහත පොලිස් භාරයට ගන්නා ලද **රුපියල් කෝටි විසි අටකට අධික මුදල වැටලීමකදී, මූල්‍යමය වශයෙන් සොයා ගත් වැඩිම මුදල් ප්‍රමාණය** වේ. පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

අත්අඩංගුවට ගත් දේපළ වල ඡායාරූප











පොලිස් මාධ්‍ය කොට්ඨාසය